# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2010 ජනවාරි මස 22 වන දින

II වන කොටස

අතිරේකය

(2010 01. 25 දින නිකුත් කරන ලදී)

## වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන)

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් 1983 අංක 24 දරන ( මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 9 වන වගන්තියට ඉක්බිතිවම 9අ සහ 9ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් එකී පනත මෙයින් සංශෝධනය කරන අතර, එකී අලුත් වගන්තිවල නීතිය බලපෑම පහත දැක්වෙන පරිදි වේ; එනම්—

(අ) 9අ වගන්තිය මගින්—

(i) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර මිය යන රාජ්‍ය නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයන් සහ දරුවන්ට, එකී නිලධාරිනිය මිය ගිය දින සිට, එකී නිලධාරිනිය එසේ මිය ගිය දින වන විට ලැබූ වැටුපට සමාන විශ්‍රාම වැටුපක් ඇය විශ්‍රාම ගත යුතු දින දක්වා ලැබීමටත්, එකී විශ්‍රාම ගැනීමේ දිනයෙන් පසු මේ පනතේ විධිවිධාන අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමටත් හිමිකම සලසනු ලැබේ.

(ii) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සේවයේ නියුක්තව සිටියදී මිය යන රජයේ සේවයේ අනියම සේවිකාවන්ගේ වැන්දඹු පුරුෂයන් හා දරුවන්ට, එකී සේවිකාව මිය ගිය දින සිට ඇය එසේ මිය ගිය දින වන විට ලබමින් සිටි ගෙවීමට සමාන ගෙවීමක් ඇය ජීවත්වූයේ නම් ඇයට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින දක්වා ලැබීමටත් වයස පනස් පහ ඉක්මවූ පසු මේ පනතේ විධිවිධාන අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමටත් හිමිකම සලසනු ලැබේ.

(ආ) 9අ වගන්තිය මගින් විශ්‍රාම වැටුප් සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයන්ට, එකී නිලධාරිනියගේ මරණයෙන් පසු, ඇය විශ්‍රාම යාමේ දී ලබන වැටුප් මත ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට විධිවිධාන සලසනු ලබයි.

*3 වන වගන්තිය :* මෙ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ගැහැනු අනත්දරුවකුට ඇයගේ විවාහය නොතකා, ඇයගේ මවගේ මරණින් පසු ඇයට අවුරුදු විසිහය වන තෙක් විශ්‍රාම වැටුපකට හිමිකම ලැබීමට විධිවිධාන සැලසීම වේ.

*4 වන වගන්තිය :* මෙ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පරිච්ඡින්න කොට අලුත් වගන්තියක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතියේ බලපෑම වන්නේ ස්වකීය භාර්යාවගේ අවැමෙන් පසු විශ්‍රාම වැටුපක් ලබමින් සිටින වැන්දඹු පුරුෂයකු නැවත විවාහ වූ විටක එකී විශ්‍රාම වැටුපෙන් භාගයක් ලැබීමටත්, යම හෙයකින් එකී නැවත විවාහය අවලංගු වූ විටක දී වුව ද, එහි වෙනසක් නොවන ලෙසටත් එකී දෙවන විවාහය නිසා ඔහුට අහිමි වූ කොටස පළමු විවාහයේ දරුවන්ට ලැබීමටත් විධිවිධාන සැලසීම වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට නව අතුරු විධානයක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, එකී සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ තනතුර අහෝසි කිරීමේ හේතුවෙන් නියමිත විශ්‍රාම දිනය එළඹීමට පෙර විශ්‍රාම ගනු ලැබූ සහ අරමුදලට දායක මුදල් ගෙවීම නතර කළ රාජ්‍ය නිලධාරිනියකට ඇය විශ්‍රාම ගත් දිනයෙන් පසු ඇතුළත් වන විවාහයක් සම්බන්ධයෙන් නැවත දායක මුදල් ගෙවීම ආරම්භ කිරීමට ඉඩ සැලසීම වේ.

*6 වන වගන්තිය* : මෙ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම 26අ අලුත් වගන්තියක් ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, එහි නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු දායකයකු වන රාජ්‍ය නිලධාරිනියක වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපකට හිමිකම නොලබා රාජ්‍ය සේවය හැර ගිය විටක, ඇයගේ මරණින් පසු ඇය විසින් අරමුදලට ගෙවන-ලද දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම වැටුපකට ඇයගේ වැන්දඹු පුරුෂයා සහ දරුවන්ට හිමිකම ලබා දීම ය.

*7 වන වගන්තිය* : මෙ වගන්තිය මගින්—

(අ) අරමුදලේ දායකයකු වූ රජයේ නිලධාරිනියක මෙ පනතේ 9අ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත මෙ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක ඇයගේ වැන්දඹු පුරුෂයා හා දරුවන්ට එකී (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි ; සහ

(ආ) රජයේ සේවයේ තාවකාලික හෝ අනියම් සේවිකාවක ලෙස සේවයේ යෙදී සිටි යම් කැනැත්තියක් එසේ සේවයේ සිටියදීම මෙ පනතේ, 9අ වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත, මෙ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක, ඇයගේ වැන්දඹු පුරුෂයාට හා දරුවන්ට එකී (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි.

*8 වන වගන්තිය* : මෙ වගන්තිය මෙ පනතේ 7 වන වගන්තියේ කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*9 වන වගන්තිය* : මෙ වගන්තිය මගින් මෙ පනතේ 4, 5 සහ 6 වන වගන්තිවල විධිවිධාන අතීතයට බලපෑමට සලසනු ලබන්නේ ය.

## වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 60/2006.

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2010 අංක    දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1983 අංක 24 දරන පනතට 9අ සහ 9ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත, එහි 9 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"හදිසි නීති නියෝග ආදිය යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියා හේතුවෙන් මිය යන රාජ්‍ය නිලධාරිනියන් ආදීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.

9අ. (1) මේ පනත යටතේ අඩුකර ගැනීම්වලට යටත් වන්නා වූ යම් නිලධාරිනියක්, තත්කාලයේ බලපවත්නා යම් හදිසි නීති නියෝගයක් යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඇය විශ්‍රාම ගන්නා වයසට එළඹීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ නිලධාරිනියන්ගේ වැන්දඹු පුරුෂයා සහ දරුවන් ;

(අ) ඇය මියගිය අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප මත පදනම්ව මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඇය මිය ගිය දින සිට, ඇය ජීවත්ව සිටියේ නම් ඇය ඇයගේ විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දිනය තෙක්, ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ;

(ආ) ඇය විශ්‍රාම ගත යුතු වයස තෙක් ලැබීමට හිමිකම තිබූ සියලු වැටුප් වැඩිවීම් සහිත වූ සංශෝධිත වැටුප මත පදනම්ව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු

PL 004616 -440(2009/12)

ලබන විශ්‍රාම වැටුපක්, ඇය ජීවත්ව සිටියේ නම් ඇය විශ්‍රාම ගැනීමේ වයසට එළඹිය යුතු වූ දින සිට සහ ඉන් පසුව ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, විශ්‍රාම ගැනීමේ වයස යන්න, අදාළ නිලධාරිනියගේ මරණය පිළිබඳ අවස්ථානුගත තත්ත්වයන් ද, ඇයගේ සේවා කාලය ද, එක් එක් විශේෂ සිද්ධියට බලපාන වැදගත් වෙනත් විස්තරද සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

(3) රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක් දරන, කාන්තාවක වන්නා වූ යම් කැනැත්තියක, සේවා කාලය තුළ දී, හදිසි නීති නියෝග යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඇය සේවයේ ස්ථිර වීමට පෙරතුව මිය යන අවස්ථාවක දී මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ කැනැත්තිය, මිය ගිය දින සිට මේ පනතේ 9 වන වගන්තියට අදාළ වන්නා වූ නිලධාරිනියක ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ කැනැත්තියගේ වැන්දඹු පුරුෂයා සහ දරුවන්—

(අ) එකී මිය ගිය දින සිට, ඇය ජීවත්ව සිටියේ නම් ඇයට අවුරුදු පනස් පහ එළඹෙන දින තෙක් කාලය තුළ, මිය යන විට ඇය විසින් උපයමින් තිබූ ගෙවීම මත පදනම්ව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කළ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ; සහ

(ආ) ඇය ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු පනස්පහ වනතෙක් ලැබීමට හිමිකම් තිබූ සියලු වැටුප් වැඩිවීම සහිත විශ්‍රාම වැටුපක් ඇයට වයස අවුරුදු පනස් පහ ලැබිය යුතු දින සිට සහ ඉන් පසු ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තියක ඇය රාජ්‍ය සේවයට බැඳුණු දින සිට පනත යටතේ දායිකාවක වූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධාරිනියන් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තියන් ඔවුන් මිය ගිය දින වන විට අරමුදලට අයවිය යුතු දායක මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා —

"හදිසි නීති නියෝග" යන්නෙන් (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග කිසිවක් අදහස් වේ ;

"ස්වාභාවික ආපදා" යන්නට 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ නිලධාරිනියන්ගේ වැන්දඹු පුරුෂයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.

9.(ආ) 9 වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොට ඇති ; සහ

(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන,

යම් නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයකු, ඒ නිලධාරිනියගේ අභාවයෙන් පසු, විශ්‍රාම යන අවස්ථාවේ ඒ නිලධාරිනිය විසින් උපයන ලද වැටුප

මත පදනම්ව මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබූ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

දායක මුදල් ප්‍රමාණය එකී නිලධාරිනිය විසින් උපයන ලද වැටුප මත පදනම්ව ගණනය කළ යුතු අතර, අවුරුදු පහක සම්පූර්ණ කාලයක් සඳහා ඒ දායක මුදල් පොළිය සමග ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, එකී දායක මුදල් උපචිත පොළිය සමග ගෙවා ඇතිනම් හෝ එය එසේ ගෙවන තෙක්, මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගනක්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "අවිවාහක ගැහැණු අනත් දරුවකු" යන වචන වෙනුවට "ගැහැණු අනත් දරුවකු" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"වැන්දඹු පුරුෂයකු නැවත විවාහ වීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

18. (1) දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු නැවත විවාහ වීමේ දී, ඔහුට ඒ දෙවන විවාහය වූ දිනට පසුව සිට විශ්‍රාම වැටුප ලෙස—

(අ) ඒ දෙවන විවාහය සිදුවන අවස්ථාවේ දී ඔහු විසින් ලබමින් සිටි විශ්‍රාම වැටුපෙන් අඩක් ; හෝ

(ආ) විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබුණ ද, සැබෑ වශයෙන් එය එතෙක් නොලැබ සිටි විටෙක, ඒ දෙවන විවාහයට පෙරාතුව, වැන්දඹු පුරුෂයකු ලෙස එකී තත්ත්වයෙන් ඔහුට ලැබීමට තිබූ මුදල් ප්‍රමාණයෙන් අඩක් හෝ,

ලැබිය යුතු වන්නේ ය.

(2) ඉහත (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව වැන්දඹු පුරුෂයකුට ගෙවීම් කිරීමෙන් පසු, දෙවන විවාහයට පෙර වැන්දඹු පුරුෂයා ලබමින් සිටි විශ්‍රාම

වැටුපේ ඉතිරි කොටස වැන්දඹු පුරුෂයාගේ ප්‍රථම විවාහයේ දරුවන් විසින් ලැබිය යුතු ය.

(3) ඒ දෙවන විවාහයේ කලත්‍රයාත් මේ පනත යටතේ දායිකාවක වන අවස්ථාවක දී සහ ඒ කලත්‍රයාගේ මරණින් පසු ඒ කලත්‍රයා විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් ද විශ්‍රාම වැටුපක් ලැබීමට ඒ වැන්දඹු පුරුෂයා හිමිකම ලබන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව විශ්‍රාම වැටුපක් ලෙස ඔහු විසින් ලැබූ යම් මුදලක් ඔහුට ගෙවීම දෙවන විවාහයේ ඔහුගේ කලත්‍රයා මියගිය දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කළ යුතු ය :

එසේ වුව ද, ඉහත විධිවිධාන සලසා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ගෙවීම අවසන් කරන ලද අවස්ථාවක දී, වැන්දඹු පුරුෂයාගේ පළමු විවාහයේ දරුවන්හට, ඔවුන්ගේ පියාගේ දෙවන විවාහයේ කලත්‍රයා මිය ගිය දින සිට (2) වන උපවගන්තියේ නියමයන්ට අනුව ඔවුන් ලබමින් සිටි කොටස් සහ එකී අවසන් කිරීමට පෙරාතුව (1) වන උපවගන්තිය විධිවිධානයන් ප්‍රකාරව තම පියා ලබමින් තිබූ යම් මුදලක් ද ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, වැඩි දුරටත්, ඒ දෙවන විවාහය විසුරුවා හරින අවස්ථාවක දී වැන්දඹු පුරුෂයාට (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඔහු ලැබූ අර්ධය විශ්‍රාම වැටුපක් ලෙස ලැබීමට හිමිකම් ලැබිය යුතු අතර, 2 වන උපවගන්තිය යටතේ දරුවන්ට ඇති හිමිකමේ වෙනසක් නොවන්නේ ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය "විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ ය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

"විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ ය:

එසේ වුවද, තනතුර අවලංගු කිරීමේ හේතුවෙන් අකාලයේ විශ්‍රාම ගන්නා වූ ද, මේ පනතින් නියමකොට ඇති පරිදි දායක මුදල් ගෙවීම නතර කරනු ලැබුවා වූ ද දායිකාවක සම්බන්ධයෙන් වූ විට, එකී දායිකාව ඇයට වයස අවුරුදු පනස් පහ ලැබීමට පෙර විවාහයකට ඇතුල් වන්නේ නම්, හිඟව පවතින සියලු දායක මුදල්,

ඒ මත පොලිය ද සමග ගෙවීමෙන් පසු, ඒ විවාහය සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන අනුව ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට ඇයට හිමිකම ඇත්තේ ය.".

26අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරන අතර, එය එකී ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

"අදාළ දිනයට හෝ ඉන්පසුව දායිකාවන්. බවට පත්වන සහ විශ්‍රාම වැටුපක් නොමැතිව රාජ්‍ය සේවය හැර යන විවාහක රාජ්‍ය නිලධාරිනියන්ට අදාළ කරගත හැකි විශේෂ විධිවිධාන.

26අ. විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූ සහ තම අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමට පෙරාතුව වසර දහයක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට එහෙත් විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම නොලබා රාජ්‍ය සේවය හැරයන රජයේ නිලධාරිනියකට ඇය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවන ලද දායක මුදල් සියල්ල හෝ ඉන් කොටසක් හෝ ආපසු ලැබීමට හිමිකම නොමැත්තේ ය.

එසේ වුව ද, එකී රජයේ නිලධාරිනියගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට ඇයගේ අභාවයෙන් පසු ඇය විසින් ගෙවන ලද දායක මුදල මත මේ පනතේ විධිවිධාන අනුව ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇත්තේ ය.

මෙ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව මිය ගිය තැනැත්තන්ට ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තියේ විධිවිධාන අදාළ වීම.

7. (1) 9අ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකව සිටි සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතු යටතේ මිය ගිය රාජ්‍ය නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට අවශ්‍ය වෙනස් කිරීම සහිතව අදාළ විය යුතු ය.

(2) 9අ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, කාන්තාවක වූ සහ රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් තනතුරක සේවය කරමින් සිට මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති අවස්ථානුගත හේතු යටතේ සේවයේ යෙදී සිටිය දී මියගිය තැනැත්තියකගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට අවශ්‍ය වෙනස් කිරීම සහිතව අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තියක ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ දායිකාවක ලෙස සැලකිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සහ එහි (1) වන උපවගන්තියේ සඳහන් නිලධාරිනියන් ද, (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තියන් ද විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවිය යුතු සියලුම දායක මුදල් එක් එක් තැනත්තිය මිය ගිය දින වන විට සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

හිමිකම පෑම අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු බව.

8. මේ පනතේ 7 වන වගන්තියේ සඳහන් යම් නිලධාරිනියකගේ හෝ තැනැත්තියකගේ අවස්ථාවෝචිත පරිදි යම් වැන්දඹු පුරුෂයකු හෝ දරුවකු හෝ දරුවන්, අමාත්‍යවරයා විසින් ගැසට්පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර, ඔවුන්ගේ හිමිකම් පෑම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින් එම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

අතීතයට බලපෑම.

9. මේ පනතේ 4, 5 සහ 6 වන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වනු ලැබූ දිනයේ සිට බලපැවැත්වෙන ලෙස සැළකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.